# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1837/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | | දිනය<br>திக<br>Date | 12/12/2024<br>පැය 1340 |


**මාධ්‍ය නිවේදනය**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

**01. අධිවේගී මාර්ගයේ සිදු වූ මාරක රිය අනතුරෙහි වැඩිදුර වාර්තාව.**

2024.12.11 වන දින රාත්‍රී කාලයේ දක්ෂිණ අධිවේගී මාර්ගයේ 100 එල් හා 100.1 එල් ස්ථාන අතරදී කොට්ටාව දෙස සිට පාලටුව දෙසට ධාවනය වූ කාර් රථයක රියදුරුට නින්ද යාම හේතුවෙන් එම දිසාවටම ඉදිරියෙන් ගමන්ගත් ලොරි රථයක පිටුපස ගැටී අනතුරක් සිදුව තිබුණි.

අනතුරින් කාර් රථයේ ගමන්ගත් එකම පවුලේ මව පියා සහ දියණියන් දෙදෙනෙකු බරපතල තුවාල ලබා කරාපිටිය රෝහලට ඇතුළත් කිරීමෙන් පසු එක් දැරියක් මිය ගිය අතර එම අනතුරින් කරාපිටිය රෝහලේ ප්‍රතිකාර ලැබූ අනෙක් දියණියද අද දින අළුයම් කාලයේ දී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 12 ක් වූ නූපේ, මාතර ප්‍රදේශයේ පදිංචි දැරියක් වේ.**

මෘත ශරීරය කරාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට සම්බන්ධ වැඩිදුර විමර්ශන ඉමදූව පොලිසිය මඟින් සිදු කරනු ලබයි.

**02. මාරක රිය අනතුරක් - ඇහැළියගොඩ පොලිස් වසම.**

2024.12.12 වන දින අළුයම් කාලයේ රත්නපුර - අවිස්සාවේල්ල ප්‍රධාන මාර්ගයේ ඇහැළියගොඩ රෝහල් හන්දිය ප්‍රදේශයේදී කාර්මික දෝෂයකට ලක්ව මාර්ගය අයිනේ නවතා ඇති අතර අවිස්සාවේල්ල සිට රත්නපුර දෙසට ධාවනය වූ කාර් රථයක් රියදුරුට වේගය පාලනය කර ගැනීමට නොහැකිව ලොරි රථයේ පිටුපස ගැටී අනතුරක් සිදු වී ඇත. අනතුරින් කාර් රථයේ රියදුරු,

බිරිඳ සහ කුඩා දැරියක් බරපතල තුවාල ලබා ඇහැලියගොඩ රෝහලය ඇතුලත් කිරිමේදි කුඩා දැරිය මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 02 මාස 06 ක් වූ මැදමහවැව, මහවැව ප්‍රදේශයේ පදිංචි දැරියක් වේ.**

මෘත ශරීරය ඇහැලියගොඩ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. තුවාලකරුවන් වැඩිදුර ප්‍රතිකාර සඳහා රත්නපුරය රෝහලට ඇතුලත් කර ඇති අතර අනතුරට සම්බන්ධ වැඩිදුර විමර්ශන ඇහැලියගොඩ පොලිසිය මඟින් සිදු කරනු ලබයි.

## 03. සැකකටයුතු මරණයක් - හබරණ පොලිස් වසම.

2024.12.12 වන අද දින උදෑසන කාලයේදී හබරණ පොලිස් වසමේ පුවක්පිටිය පාර, ලක්සිරිගම ප්‍රදේශයේ කැපුම් තුවාල සහිතව පුද්ගලයෙකු මියගොස් ඇති බවට හබරණ පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 48 ක් වූ පුවක්පිටිය පාර, ලක්සිරිගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘතශරිරය සම්බන්ධයෙන් කැකිරාව ගරු මහේස්ත්‍රාත්තුමා විසින් මහේස්ත්‍රාත් පරික්ෂණයක් සිදු කර පශ්චාත් මරණ පරික්ෂණය සඳහා පොලොන්නරුව රෝහලේ මෘතශරිරාගාරයේ තැන්පත් කර ඇත. මරණයට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැති අතර සිද්ධිය සම්බන්ධයෙන් හබරණ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**